**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

**ප්‍රසම්පාදන දැන්වීමයි**

**<u>කොළඹ 10, ඕල්කට් මාවත, කොළඹ බඩු ගබඩා සංකීර්ණයේ බඩු ගබඩා ගොඩනැගිලි සහ කොළඹින් පිටත බඩු ගබඩා භාණ්ඩ ගබඩා කිරීමට හෝ ව්‍යාපාර කටයුත්තක් සඳහා වසර 05කට බදුලබා දීම සඳහා ලංසු කැඳවීම.</u>**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් කොළඹ බඩු ගබඩා සංකීර්ණයේ හා කොළඹින් පිටත දුම්රිය ස්ථාන පරිශ්‍රවල පිහිටි පහත බඩු ගබඩා වසර පහක කාලයකට බදු ලබාදීම පිණිස ලංසු කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

**කොළඹ බඩු ගබඩා සංකීර්ණයේ පවතින බඩු ගබඩා**

| අනු අංකය | බඩු ගබඩාව | ප්‍රමාණය (ව.අ) |
|---|---|---|
| 1 | C1-G | 1872 |
| 2 | C1– F | 3744 |
| 3 | C1-D | 3870 |
| 4 | C2 - E | 5792 |

**කොළඹින් පිටත දුම්රිය පරිශ්‍රවල පවතින බඩු ගබඩා**

| අනු අංකය | ගබඩාව පිහිටි ප්‍රදේශය | ප්‍රමාණය (වර්ග අඩි) |
|---|---|---|
| 1 | කටුගස්තොට | 2600 |
| 2 | මීරිගම | 1711 |
| 3 | අම්බලන්ගොඩ | 1280 |
| 4 | කඩුගන්නාව | 8000 |
| 5 | මාදම්පේ | 1960 |
| 6 | තලවකැලේ I | 8000 |
| 7 | තලවකැලේ II | 1500 |
| 8 | හපුතලේ විශ්‍රාම ශාලා ගොඩනැගිල්ල | 1593 |
| 9 | මාතලේ | 730 |

**<u>01.සුදුසුකම්</u>**

දෙපාර්තමේන්තු කොන්දේසි වලට යටත්ව වඩාත් සුදුසු මිලදීමනාකරුට අදාල බඩු ගබඩා බදු ලබාදීම කටයුතු කරනු ඇත.

**<u>02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම</u>**

ටෙන්ඩර් අයදුම්පත් ලියවිලි 2024 ජනවාරි මස 10 වන දින ප.ව.2.00 දක්වා දුම්රිය වෙළඳ හා අලෙවි කාර්යාලයෙන්, බඩු ගබඩා නියෝජිත (කොළඹ), අදාල දුම්රිය ස්ථානය වෙතින් ලබා ගත හැක. ඒ සඳහා කොළඹ 10 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මුල්‍ය නිලධාරී වෙත, බඩු ගබඩා නියෝජිත (කොළඹ) වෙත හෝ අදාල දුම්රිය ස්ථානය වෙත ආපසු ගෙවනු නොලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු. 2,500/- ක මුදලක් ගෙවා ලබා ගන්නාලද ලදුපත දුම්රිය මුලස්ථානයේ නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) වෙත, බඩු ගබඩා නියෝජිත වෙත හෝ දුම්රිය ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතුය. ලංසු පෝරම ගාස්තුවට අමතරව එම ලේඛණයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කරයක්ද ගෙවිය යුතුය. එක් ලංසු පෝරමයක් මගින් ලංසු ඉදිරිපත්කල හැක්කේ එක් බඩු ගබඩාවක් සඳහා පමණි.

**<u>03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම</u>**

ඉහත 02 යටතේ සඳහන් ආකාරයට ලබාගන්නා ලද අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසි පරිදි සම්පූර්ණ කර කවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනුපිටපත ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය. එම කවර දෙක තනිකවරයක බහා වම් පස ඉහල කෙළවරේ "ගබඩාවේ නම හා කොළඹ දුම්රිය බඩු ගබඩා ගොඩනැගිලි/කොළඹින් පිටත බඩු ගබඩා සඳහා මිල ගණන් කැඳවීම" යනුවෙන් සඳහන් කොට, එම කවරය මුද්‍රා තබා 2024 ජනවාරි මස 11 වන දින ප.ව 02.00 පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෙළඳ හා අලෙවි අංශය, දුම්රිය මුලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මුලස්ථාන නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) ගේ නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**<u>04. ලංසු භාරගැනීම හා විවෘත කිරීම</u>**

2024 ජනවාරි මස 11 වන දින ප.ව.2.00 ට ඉහත 03 ඡේදයේ දක්වා ඇති පරිදි වෙළඳ හා අලෙවි කාර්යාලයේදී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

05. ලංසු අයදුම් කිරීමට ප්‍රථම ඉහත සඳහන් බඩු ගබඩා පරීක්ෂා කිරීම සඳහා අයදුම්කරුවන් හට අවස්ථාව ලබා දෙන අතර ඒ සඳහා බඩු ගබඩා නියෝජිත (කොළඹ) වෙතින් හෝ අදාල දුම්රිය ස්ථානයෙන් අවසර ලබා ගත යුතු වේ.

06. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

07. ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍ය නම් දුරකථන අංක :-011-2421281 – (දිගු අංකය -8235) හරහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වෙළඳ හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
දුම්රිය මුලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.